# දෙවියන් වෙත මඟ





© 2009 by World Missionary Press, Inc.,
Rose Goodman, author. Cover art Edwin B. Wallace.

# දෙවියන් විසින් අප ලොව හා සියලු ජීවීන්ද මවන ලදී



**"පටන්ගැන්මේදී දෙවියන් අහසත් පොළොවත් මැවීය."**

- උත්පත්ති 1:1

**"ස්වර්ගවලද, පොළොවේද ඇති සියල්ල එතුමා විසින් මවන ලදී."**

- කොලොස්සි 1:16

**"අහසත් පොළොවත් මැවූ ස්වාමින්ගෙන් ඔබලා ආසිරි ලදහ. ස්වර්ගය සහ සියලුම ස්වර්ග ස්වාමින්ගේය. නමුත් එතුමා පොළොව මිනිස් පුතුනුවන්ට දුන්නේය."**

- ගීතාවලිය 115:15, 16

දෙවියන් පොළොව මිනිසාට දෙන විට, එය සර්වසම්පූර්ණව තිබුනා. එයට කුමක්වීද යත් දැනගැනීමට, මෙම පොත කියවන්න.

# දෙවියන් විසින් අපව සාදන ලදී



තවද දෙවියන්: අපගේ ස්වරූපයෙන් අපගේ සමානත්වයට, අපි මිනිසාව සාදමු. ඔවුහු..... පොළොව කෙරෙහි ආණ්ඩුකෙරේවා කීය.

- උත්පත්ති 1:26

# මිනිසා ජීවමාන ප්‍රාණයක් විය



**"ස්වාමිවූ දෙවියන් පොළොවේ දූවිල්ලෙන් මනුෂ්‍යා සාදා ඔහුගේ නාස්පුඩු තුළට ජීවනයේ හුස්ම හෙළීය; එවිට මනුෂ්‍යා ජීවමාන ප්‍රාණයක් විය."**

- උත්පත්ති 2:7

**ස්වාමිවූ දෙවියන් කතා කර : මනුෂ්‍යා තනිව සිටීම හොඳ නැත; ඔහුට සුදුසු සහකාරියක් සාදා දෙමියි කීය.......... ස්වාමිවූ දෙවියන් ආදම්ව තද නින්දකට පත් කළේය, ඔහු නිදා ගත්තේය; එතුමා ඔහුගේ ඉළ ඇටයෙන් එකක් ගෙන, එම පෙදෙස මාංසයෙන් පිරවිය. ස්වාමිවූ දෙවියන් මනුෂ්‍යාගෙන් ගත් ඉළ ඇටයෙන් ස්ත්‍රියක් සාදා, ඇයව මනුෂ්‍යා වෙත ගෙන ආවේය.**

- උත්පත්ති 2:18, 21, 22

ජීවමාන ප්‍රාණයක් යනු, සදාකාලිකව අප කොහේ හෝ ඉන්නා බවයි.

# ආදම් සහ ඒව දෙවියන්ට අකීකරු වුහ



සාතන්ගේ හඬට කිසිසේත් අප ඇහුම්කන් දිය නොයුතුයි.

**“ස්වාමිවූ දෙවියන් මනුෂ්‍යා රැගෙන ඒදන් උයන වවන්ටත්, බලාගන්ටත් එහි පදිංචි කළේය. ස්වාමි වූ දෙවියන් මනුෂ්‍යාට අණ කරමින්: කැමති ලෙස ඔබට උයනේ ගස්වලින් කෑමට පුළුවන; එහෙත් යහපත හා නපුර දැනගැනීමේ ගහෙන් කන්නට එපාය. මක්නිසාද එයින් කෑ දවසේ ඒකාන්තයෙන්ම ඔබ නසින්නේයයි කීවේය.”**

- උත්පත්ති 2:16,17

## යක්ෂයා නොහොත් සාතන් කියන සර්පයා දෙවියන්ගේ බලමහිමය ප්‍රශ්නකර, බොරුවක් කීවා.

**“සර්පයාද : ඇත්තටම ඔබලා නසින්නේ නැතැයි, සත්‍රියට කීවේය. ස්ත්‍රියද, ඒ ගහෙන් කෑම හොඳ බවද, එය ඇස්වලට ප්‍රිය බවද, නුවණ ලැබීමට ආසා විය යුතු ගහක් බවද දැක, එහි ගෙඩි ගෙන කෑවාය............ සිය සැමියාටත් දුන්නාය. ඔහුද කෑවේය.”**

- උත්පත්ති 3:4, 6

# 6 ආදම් සහ ඒවට තවත් එම උයනේ සිටීමට බැරි වුහ



"........ඔහුව ගත් පොළොව, ඔහු විසින්ම වවන පිණිස ස්වාමිවු දෙවියන්, ඒදන් උයනෙන් ඔහුව පිට කළේය........ ජීවන ගහට යන මග රැකවල්කරන පිණිස එතුමා.......... වෙරුබ්වරුන්ද..........ගිනිමය වු කඩුවක්ද තැබීය."

- උත්පත්ති - 3:23, 24

# ආදම් සහ ඒව පව් කළ දිනය සියලු මිනිසාටම කණගාටු දිනයක් විය



**"....එක් මිනිසෙකු නිසා පාපයත්, පාපය නිසා මරණයත් ලෝ ඇතුල්වූ සේ...... සියල්ලන් කෙරෙහි මරණයද පැමිණුනේය."** - රෝම 5:12

## මතක තබාගන්න

**සියල්ලෝම** පාපී ස්වභාවයෙන් ඉපදී සිටින නිසාත්, **මරණය පාපය නිසා ආ නිසාත්, යම් දිනක සියල්ලෝම මිය යති.** (රෝම 5:12 නැවත කියවන්න)

# 8 අපව පාපයෙන් ගළවාගැනීමට දේව සැළැස්ම වූයේ දෙවිඳුන්ගේ ඒකජාතක පුතුනුවන් එවීමය



"ඇෑ පුතෙකු බිහිකරයි. එතුමට යේසුස් යන නම තබන්න. මක්නිසාද, සිය සෙනග, ඔවුන්ගේ පාපවලින් ගළවන්නේ එතුමාය."

- මතෙව් 1:21

මිනිස් වර්ගයාට ඇතුලුවීමෙහිලා මිනිස් ළදරුවෙකු මෙන් ලෝ බිහිවීමට දේව පුතුට සිදුවිය.

"මක්නිසාද, එතුමා (යේසුස් ක්‍රිස්තුස්) තුළ දේවත්වයේ සියලුම සම්පූර්ණකම ශරීරාකාරයෙන් වාසය කරන්නේය."

- කොලොස්සි 2:9

# මිනිස් ස්වභාවයක් ගත් යේසු - දෙවියන්මයි 9

"පටන්ගැන්මේදී වාක්‍යාණෝ සිටිය. වාක්‍යාණෝ දෙවියන් සමග සිටිය. වාක්‍යාණෝ දෙවියන්ව සිටිය.......... තවද වාක්‍යාණෝ මාංසවත්ව....... අප අතරේ සිටිය."
- යොහන් 1:1, 14

"මේ සියල් සිදුවුයේ: "බලන්න කන්‍යාවක් ගැබ්ගෙන පුතෙකු බිහි කරයි; එතුමට එම්මානුවෙල් යන නම තබනවා ඇත......" එහි තේරුම "දෙවියන් අප සමග" යනුයි.
- මතෙව් 1:22, 23

"මක්නිසාද, අපට ළදරුවෙක් උපන්නේය, අපට පුතෙක් දෙන ලදි; ආණ්ඩුවද එතුමගේ කර පිට ඇත. එතුමගේ නාමය අපුර්වය, මන්ත්‍රිවරයාය, පරාක්‍රමවත් දෙවියන්ය, සදාකාල පියාය, සාමයේ කුමරාය."
- යෙසායා 9:6

# යේසුස් ක්‍රිස්තුස් අප සර්ව සම්පූර්ණ පූජාවයය



"**..........පාපය නොදත් එතුමා.........**" - 2 කොරින්ති 5:21

**කිසි පාපයක් නොකළ එතුමා......**

- පේත්‍රුස් 2:22

පාපය දුරු කිරීමෙහිලා කිසිදු සර්ව සම්පූර්ණ පූජාවක් මිනිසාට කළ නොහැක.

**මක්නිසාද, ගොනුන්ගේත්, එළුවන්ගේත් ලෙයින්, පාපය දුරු කිරීමට නුපුළුවන.**

- හෙබ්‍රෙව් 10:4

දෙවියන්ගේ බැටළු පැටවා යේසුස්ය. **අන්න ලොව පාපය දුරලන දෙවියන්ගේ බැටළු පැටවා.**

- යොහන් 1:29[අ]

# අප ගැළවාගැනීම පිණිස සිය ජීවිතය යේසු පුද කළා 11

දුෂ්ට කුරිරු මිනිසුන් යේසුව එපා කළ නිසා, ඔවුහු යේසුව කුරුසියේ ඇණගැසුවා. නමුත් එතුමගේ එම මරණය දේව සැළැස්ම විය. ඔබවත්, මාවත්, රුදුරු පාපයෙන් ගළවාගැනීමට පිණිස යේසු සිය කැමැත්තෙන්ම සිය දිවි පිදුවා.

යේසු : "**කිසිවෙක් එය** (මගේ ජීවිතය) **මගෙන් උදුරාගන්නවා නොව, මමම එය දෙමි. එය දෙන්ට මට බලය ඇත නැවත ගන්නටද මට බලය ඇත...**"

- යොහන් 10:18

## දෙවියන්ගේ බැටළු පැටවාගේ නිර්මල ලෙයින් අප මිදී ඇත

"**......ඔබලා මුදනු ලද්දේ** (පාපයෙන් ගළවනු ලැබුවේ) **රන්රිදී වැනි දිරායන දෙයින් නොව......... කැලලක්වත්, පලුද්දක්වත් නැති බැටළු පැටවකුගේ ලේ වැනි ක්‍රිස්තුස්ගේ අනගි ලෙයින්ය.**"

- 1 පේත්‍රුස් 1:18, 19

## පාපය දුරු කිරීමට වෙන කිසි පූජාවකට නුපුලුවන

"**යේසුස් ක්‍රිස්තුස්ගේ ශරීරය අප සියල්ලන් වෙනුවෙන් එක්වරක් පූජා කිරීමෙන් අප පිරිසිදු කරනු ලැබ සිටිමුව.**"

- හෙබ්‍රෙව් 10:10

**12 "........ක්‍රිස්තුස්ගේ ලෙයින් ධර්මිෂ්ඨ කළ අප, එතුමා නිසා, දේව උදහසින් ගැළවී ඇත.** - රෝම 5:9



ස්වාමිනී, ඔබගේ රාජ්‍ය සමග එන විට මාවද මතක් කරන්න.

මෙම සොරා යේසුව විශ්වාස කර ගැළවීම ලැබීය.

සැබෑවක් ඔබට කියමි. අද ඔබ මා සමග පාරාදීසයේ සිටින්නේය.

- ලූක් 23:43

මෙම සොරා යේසුව අවිශ්වාස කළ නිසා ඔහුට ස්වර්ගය අහිමි විය.

**"......අප පව්කාරයන්ව (දෙවියන්ට අකීකරුව) සිටියදීම, අප වෙනුවෙන් ක්‍රිස්තුස් මැරුණේය."** - රෝම 5:8

# දේව පුත්‍රයා විශ්වාස කරන සැමට ජීවනය ඇත

"මක්නිසාද, ස්වකීය ඒකජාතක පුත්‍රයා දෙන තරම් දෙවියන් ලෝකයාට ප්‍රේම කළේය. එසේ කළේ එතුමා කෙරෙහි අදහන කිසිවෙක් විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය"

- යොහන් 3:16

**"අන්ධකාරයේ බලයෙන් අප මුදා, සිය ප්‍රේමයේ පුත්‍රයාගේ රාජ්‍යට පියාණන් අප කැඳවා ගත්තේය. එතුමගේ ලෙය තුළ අපගේ *මිදීම වන පාප කමාව අපට ඇත."** - කොලොස්සි 1:13, 14

* මිදීම යනු මිළයකට අපව නැවත ගනු ලැබීම.

# එතුමා නැවත නැගිට්ටේය

"දේවදූතයා ස්ත්‍රීන්ට
කථා කර, බිය
නොවන්න,
මක්නිසාද, ඔබලා
සොයන්නේ
කුරුසියේ ඇණගැසූ
යේසුව බව දනිමි.
එතුමා මෙහි නැහැ;
කී ලෙසම නැගිට්ටා.
එන්න, ස්වාමින් සිටි
තැන බලන්න......"

- මතෙව් 28:5, 6



# යේසු මරණින් නැගිට්ටේය



**මම මැරුණෙමි. නමුත් බලන්න, දැන් මම සදාකල්හිම ජීවත්ව සිටිමි. ආමෙන්. පාතාලයේද** (අපාය), **මරණයේද යතුරු මට ඇත.** - එළිදරව් 1:18

"**........මා ජීවත් වන නිසා ඔබලාද ජීවත් වන්නහුය.**" - යොහන් 14:19

යේසු මරණය පරාජය කළ නිසාත්, මරණයේ යතුරුද එතුමා ළඟ නිසාත්, මරණයට අප බිය විය යුතු නැහැ.

"**මට බිය ඇති වූ විට, මම ඔබ කෙරෙහි විශ්වාස කරමි.**"

(දේව පොරොන්දුව සඳහා 46 වන පිටුව බලන්න) - ගීතාවලිය 56:3

ඔබව ගැළවාගැනීමට යේසුට පුලුවන - ඔබ ගැන එතුමා යාඥා කරයි

**නමුත් එතුමා සදාකල්හිම සිටින නිසා.... එතුමා තුළ දෙවියන් වෙත ළඟාවන්නන් උදෙසා මැදහත්කාරකම් කරන පිණිස එතුමා නිරතුරුවම ජීවත්වන නිසා, කෙළවර දක්වාම ඔවුන්ව ගැළවීමට එතුමට පුළුවන.** - හෙබ්‍රෙව් 7:24, 25

# ඔබට හා මට සදාකාල ජීවනය ලබාගැනීමට පුළුවන




**ඔබ ගන්නේ මොන මගද ?**

දෙවියන් සමග සදාකාල **ජීවනයට** ඇති එකම **මග** යේසුස් ක්‍රිස්තුස්ය.

සදාකාල **මරණයට** ඇති මග යක්ෂයාය (සාතන්)

සදාකාල ජීවනය පිණිස මෙම ළමයා හරි තීරණය ගනියි.

# ඔබ ගන්නා තීරණය කුමක්ද ? 

**........ඔබලා කාහට සේවය කරම්ද යත් අදම තෝරාගන්න.**

- යෝෂුවා 24:15

**........එබැවින් ඔබත්, ඔබේ වංශයත් ජීවත්ව සිටින පිණිස ජීවනය තෝරාගන්න.** - ද්විතීය කතාව 30;19

සදාකාල ජීවනයට ඇති එකම මග යේසුස්ය

**වෙන කිසිවකු තුළ ගැළවීම නැත. මක්නිසාද, අප ගැළවීමට අවශ්‍ය මිනිසුන් අතරේ දෙන ලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත.**

- ක්‍රියා 4:12

**මම, මමම ස්වාමින්ය. මා ඇරෙන්න වෙන ගැළවුම්කරුවෙක් නැත.**

- යෙසායා 43:11

# අපට සදාකාල ජීවනය වුවමනා නම් ඇයි අප යේසුවම තෝරාගත යුතු

***01. යේසු පමණයි අප සොයා ආවේ.***



**"....ඔවුන්ට ජීවනය ලැබෙන පිණිස මම ආවෙමි......."** - යොහන් 10:10

***02. අපට ප්‍රේමකර, අප උදෙසා මරණය වින්දේ යේසු පමණයි.***

**"....මට ප්‍රේමකර, මා උදෙසා තමන්ම කැපවූ දේව පුතුනුවන්....."**

- ගලාති 2:20

යේසු, අප මෙන් මාංසයද ලෙයද ඇති මිනිසෙකු වුයේ, **මරණය කෙරෙහි බලය**

**ඇති යක්ෂයාව, මරණය තුළින්ම බල රහිත කර, ජීවිතය** 
**මුළුල්ලේම මරණයට බියෙන්ද, වහල්කමට යටත්වද සිටි සියල්ලන්වම නිදහස් කරන පිණිසය.** - හෙබ්‍රෙව් 2:14, 15

***03. අප පාපයට ඇති එකම විසඳුම යේසුගේ ලේ පමණයි.***

"**........මක්නිසාද, ආත්මයට සමගිකමක් (කමා කිරීමක්) ඇති කරන්නේ ලෙයය.**" - ලෙවි කතාව 17:11

"**........එතුමගේ පුතුනුවු යේසුස් ක්‍රිස්තුස්ගේ ලෙය සියලු පාපවලින් අපව පිරිසිදු කරයි.**" - 1 යොහන් 1:7

"**එතුමා තුළ අපගේ මිදීම** (ගැලවීම) **වන පව්වලට කමාව ඇත**" - කොලොස්සි 1:14

## *04. මරණින් නැගිට්ටේ යේසුස් ක්‍රිස්තුස් පමණයි.*



**තවද මරණින් නැගිටවනු ලද ක්‍රිස්තුස් නැවතත් නොමැරෙන බවත් මරණය එතුමා කෙරෙහි බල නොපාන බවත් දනිමුව.**

- රෝම 6:8

**"එතුමා සියල්ලන් උදෙසා මැරුණේ, ජීවත් වන අය, තවත් ඔවුන් වෙනුවෙන් ජීවත් නොවී, ඔවුන් වෙනුවෙන් මැරී, නැවත නැගිටි එතුමා වෙනුවෙන් ජීවත් වන පිණිස."**

- 2 කොරින්ති 5:15

යේසු : **"......මා ජීවත් වන නිසා ඔබලාද ජීවත් වෙති."**

- යොහන් 14:19

***05. සදාකාල ජීවනය පිණිස අපව එසවීමට නම්, අප තුළ යේසුස් ක්‍රිස්තුස්ගේ ආත්මය තිබිය යුතුයි.***

**"......තේජසේ බලාපොරොත්තුව ඔබලා තුළ සිටින ක්‍රිස්තුස්ය."**

- කොලොස්සි 1:27ඇ

**"තවද යේසුව මළවුන්ගෙන් නැගිටවූ එතුමගේ ආත්මයාණන් ඔබලා තුළ වාසය කරයි නම්, ක්‍රිස්තුස් යේසුස්ව මළවුන්ගෙන් නැගිටවූ එතුමා, ඔබලා තුළ සිටින එතුමගේ ආත්මය තුළින් ඔබලගේ මරණීය ශරීරයන්ද ජීවත් කරවයි."**

- රෝම 8:11

ක්‍රිස්තුස්ගේ ආත්මයාණන් ඔබලා තුළ ජීවත්වන බව සහතික කරගන්න

**ක්‍රිස්තුස්ගේ ආත්මය යම් කෙනෙකුට නැත්නම්, ඔහු එතුමට අයිති නැත.**

- රෝම 8:9

# 22 සදාකාල ජීවනය ඔබ සොයාගන්නේ කෙසේද?

24 පිටුවේ
සඳහන් උපදෙස්
අනුගමනය කරන්න



**ළමයෙකු වුවද,
ඔහුගේම ක්‍රියාවලින්
ඔහුව හෙළිවේ.**
- හිතෝපදේශ 20:11

"යේසු මට ආදරෙයි, ඒ බව මම දනිමි. එසේ මට බයිබලය කියයි"

# සියලුම ළමයින්ට යේසු ආදරෙයි

**"නමුත් යේසු ඔවුන් තමන් ළඟට කැඳවා : ළදරුවන් නොවළක්වා මා ළඟට එන්න ඉඩ දෙන්න. මක්නිසාද, දෙවියන්ගේ රාජ්‍යය මෙබඳුය."**

- ලූක් 18:16

**"එසේම මේ බාලයන්ගෙන් එක්කෙනෙක්වත් විනාශවෙනවාට (සදාකාලික විනාශයට හෝ නැතිවීමට) සවර්ගයේ සිටින ඔබලාගේ පියාණන් කැමති වන්නේ නැත."** - මතෙව් 18:14

ඔබ කවුරු වුනත්, කොහේ සිටියත් කම් නැහැ. යේසු ඔබට ආදරෙයි. එනිසයි යේසු ඔබ වෙනුවෙන් සිය දිවි පිදුවේ. ඔබගේ ආදරයද යේසුට වුවමනායි. යේසුට කීකරුව ජීවත්ව ඔබගේ ආදරය එතුමට පෙන්වීමට ඔබට පුළුවන.

**"ඔබලා මට ආදරේ නම්, මාගේ පනත් රකින්න."** - යොහන් 14:15

# 24 දෙවියන් වෙත ඔබේ මඟ සොයාගන්නේ කෙසේද

## *01. ඔබ පව්කරුවෙකු බව පිළිගන්න (දෙවියන්ට අකීකරුවූ බව)*

**"සියල්ලෝම පව්කර දේව මහිමයෙන් හීනවී සිටිති."** - රෝම 3:23

## *02. දෙවියන් වෙත යේසුස් ක්‍රිස්තුස් තුළින් එන්න.*

**"ඇත්තේ එකම දෙවි කෙනෙක් හා දෙවියන් හා මනුෂ්‍යා අතරේ එකම මැදිහත්කරුවෙකි, ඒ ක්‍රිස්තුස් යේසුස් නම් මනුෂ්‍යාය."**

- 1 තිමෝති 2:5

**එබැවින්, එතුමා (යේසුස්) තුළින් දෙවියන් වෙත එන සියල්ලන්ව ගැළවීමට (පාපයෙන්) එතුමට පුළුවන.** - හෙබ්‍රෙව් 7:25

යේසු : **".....මා වෙත එන තැනැත්තාව කිසිසේත් මම අහක දමන්නේ නැත."** - යොහන් 6:37

## *03. ඔබ කළ පව් සියල්ලට පසුතැවිලි වෙන්න.*

(පසුතැවිලිවීම නම්, පාපය සම්පූර්ණයෙන් අත්හැරීම පිණිස දුක්වීමයි.)

**"......ඔබලගේ පාප මකා දැමීමට නම්, පසුතැවිලි වී හැරී එන්න."**

- ක්‍රියා 3:19

**"........සියල්ලන්ම පසු තැවිලිවෙනවාට මිස, කිසිවකු විනාශවෙනවාට අකමැතිව, ඔබලා වෙනුවෙන් බොහෝ කල් එතුමා ඉවසා සිටියි."**

- 2 පේත්‍රුස් 3:9




## *04. ඔබ කළ පව් යේසුට කියා දෙන්න.*

**26** 25 වන පිටුවේ යාඥා අත්වල ඇති 1 යොහන් 1:9 බයිබල් පදය පහත ඉරි මත ලියන්න

...................................................................................................................................................

...................................................................................................................................................

...................................................................................................................................................

...................................................................................................................................................

## ***05. ඔබේ පාප අත්හරින්න.***

"**තම වරද සඟවන්නා දියුණු නොවෙයි; ඒවා කියාදී අත්හරින්නාට කරුණාව ලැබේ.**" - හිතෝපදේශ 28:13

"**නපුරෙන් ඉවත්වෙන්න, යහපතම කරන්න.....**". - ගීතාවලිය 37:27



## 06. යේසුස් ක්‍රිස්තුස් කෙරෙහි විශ්වාස කරන්න.

"......යේසුස්, ස්වාමින් බව ඔබේ කටින් කියන්නේ නම්, දෙවියන් විසින් එතුමව මළවුන්ගෙන් නැගිටවූ බව ඔබේ සිතින් අදහන්නේ නම් ඔබ ගළවනු ලබයි."

\- රෝම 10:9

"මක්නිසාද, ඇදහැල්ල නිසා ඒ අනුග්‍රහයෙන් ඔබලා ගැළවී සිටිති.....එය දේව දීමනාවකි; එනිසා කිසිවෙකු පාරට්ටු කරගන්නා පිණිස එය ක්‍රියාවලින් නොව"

\- එපීස 2:8, 9

"......ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්ව අදහන්න. එවිට ඔබ ගැලවෙයි. ඔබ සහ ඔබේ නිවැසියෝද ගැළවෙති."

\- ක්‍රියා 16:31

## 07. ඔබගේ සිතට හා ජීවිතයට යේසුව පිළිගන්න.

ඔබේ සිත නැමැති දොර ඇර "යේසුනි මගේ සිත තුළට එන්න" කියා, එතුමට අඬගසන්න පුළුවන් ඔබටම පමණයි. යේසු : **මම දොර ළඟ සිට තට්ටු කරමි. යමෙක් මගේ හඬ අසා දොර අරියි නම්, ඔහු තුළට මම ඇතුල්ව ඔහු සමග කෑම කන්නෙමි. ඔහුද මා සමග කන්නේය.**

- එළිදරව් 3:20



**"නමුත් යම් පමණ දෙනෙක් එතුමා පිළිගත්තෝද එනම් එතුමගේ නාමය කෙරෙහි අදහගත්තෝද, ඔවුන්ට දේව දරුවන් වීමට එතුමා බලය දුන්නේය."**

- යොහන් 1:12

# නිදසුන් යාඥාවක්

මීට පෙර ඔබ යාඥාකර නැද්ද ? යාඥා කිරීමට උදව්වක් ඕනෑද ? එහෙනම් මෙම යාඥාව නිදසුනක් ලෙස ගන්න.



**ආදර යේසු සමිඳුනි,**

**මගේ පාප අරන් දමන පිණිස, මා වෙනුවෙන් කුරුසියක දිවිපිදු නිසා ඔබට ස්තුතියි. මරණය පරදවා මරණින් පසු තෙවන දින ඔබ මරණින් නැගිට්ටා. ජීවමාන යේසුනේ, මගේ සියලු වැරදිවලට හා පාපයට මම කණගාටු වෙනවා. මට සමාවෙන්න. යේසුනි, එන්න දැන් මගේ සිත තුළට, සදාකාලයටම එහි ඉන්න. මගේ මුළු සිතම ඔබ පිවිතුරු කරන බවට මම ඔබව මුළු සිතින් විශ්වාස කරනවා. අද සිට ඔබ මගේම ආදර ගැළවුම්කරුය, ස්වාමින්ය.**

**යේසුගේම ආදර නමින්, ආමෙන්.**

# යේසු ඔබ සිත තුළ නම් ඔබට සදාකාල ජීවනය ඇත

"**..........දෙවිඳුන් අපට සාදාකාල ජීවනය දී ඇත. ඒ ජීවනය සිය පුතුණුවන් තුළ ඇත. පුතුණුවන් ඇත්තාට ඒ ජීවනය ඇත.**" - 1 යොහන් 5:11, 12

"**......මාගේ වචනය අසා මා එවූ තැනැත්තාව (දෙවියන්ව) විශ්වාස කරන්නේ නම් ඔහු............. මරණයෙන් ජීවනයට පැමිණ ඇත.**" - යොහන් 5:24

ඔබේ ශරීරය නැසුනු පසු, ස්වාමින් ඉදිරියේ ඔබ සිටියි. (2 කොරින්ති 5:8)**.........** "**තේජසේ බලාපොරොත්තුව, ඔබලාට සිටින ක්‍රිස්තුස්ය.**" (කොලොස්සි 1:27)

ඔබේ පාපයට සමාවෙන්න කියා යේසුට කීවා නම්, එතුමව ඔබේම ගැළවුම්කරු හා ස්වාමින් ලෙස විශ්වාස කරනවා නම්, එහෙනම් ඔබේ නම යටින් ලියන්න.

\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-\-

# දිගින් දිගටම යේසුව අනුගමනය කරන්නේ කෙසේද ?



දේව වචනය නොහොත් ශුද්ධ බයිබලය දිනපතා කියවන්න. ඔබට උපකාර වන සියළුම පද කටපාඩම් කර, සිත තුළ සඟවා ගන්න. (මෙම කුඩා පොතේ එවන් බොහෝය)

**"........දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල, ඉගැන්වීමටත්, තරවටුවටත්, හික්මවීමටත්, ධර්මිෂ්ඨකම ගැන කියා දීමටත් ප්‍රයෝජනවත්ය."**

- 2 තිමෝති 3:16

# ඕනෑම වේලාවක ඕනෑම තැනකදී යේසුට කතා කරන්න

ජීවිතයේ යහපත් දේ නිසා **යේසුට ස්තුති කරන්න**. ඔබ ආත්මය පාපයෙන් ගළවා ඔබට කර ඇති යහපත් වෙනස නිසා එතුමට ප්‍රසංසා කරන්න. **ඔබේ ඕනෑම උවමනාවක් ගැන යාඥා කරන්න.** යේසු නමින් පමණක්ම යාඥා කරන්න.



**"......එතුමගේ කැමැත්ත අනුව එතුමගෙන් යමක් අප ඉල්ලූ විට එතුමා ඒ ඉල්ලීම අසන්නේය."**

- 1 යොහන් 5:14

**"......මගේ නාමයෙන් පියාණන්ගෙන් ඔබලා ඉල්ලන යමක් ඇද්ද ඒ දෙය ඔබලට එතුමා දෙන්නේය."**

- යොහන් 16:23

**".....එකිනෙකා වෙනුවෙන් යාඥා කරන්න."** - යාකොබ් 5:16අ

**"......ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න, ඔබට පීඩා කරන්නන් ගැන යාඥා කරන්න."** - මතෙව් 5:44

# එතුමගේ ගෝලයන්ට යේසු ඉගැන්වූ යාඥාවක් 

(යේසුව අනුගමනය කරන්නෙක් එතුමගේ ගෝලයා වෙයි.)

මෙසේ යාඥා කරන්න කියා යේසු සිය ගෝලයන්ට කීවා :

**ස්වර්ගයේ සිටින අපගේ පියාණෙනි, ඔබගේ නාමයට ගෞරවය වේවා. ඔබගේ රාජ්‍ය ඒවා, ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළොවේද ඉටුකරනු ලැබේවා. අපේ දවස්පතා අහාරය අපට අද දෙන්න. අපේ ණයකරුවන්ට අප කමා කරනා සේ අප ණයත් අපට කමා කරන්න. අප පරීක්ෂාවට නොපමුණුවා නපුරෙන් අප ගළවාගන්න. මක්නිසාද, රාජ්‍යයත්, බලයත්, මහිමයත්, සදාකාලයටම ඔබගේය. ආමෙන්.** - මතෙව් 6:9-13

ඇදහිලිවතුන් එක්වූ විට මෙම යාඥාව ශබ්ද නගා කියන නිසා මෙම යාඥාව කට පාඩම් කරගන්න.

# අප කෙසේ ජීවත් විය යුතුද යත් දේව දස පනත අපට උගන්වයි

(නික්මයාම 20 වන පරිච්ඡේදය)

*පළමු හතර අප දෙවිඳුට අප තුළ ආදරය දන්වයි*

1. "මා ඇරෙන්ට වෙන දෙවිවරු ඔබට සිටිය නොයුතුයි."

2. "කැපූ රූපයක් හෝ........... කිසිම දෙයක සමානත්වයක් හෝ ඔබට සාදා නොගන්න, ඒවාට නමස්කාර නොකරන්න."

3. "සබත් දවස ශුද්ධව තියාගැනීමට මතක තබාගන්න."

4. "ඔබගේ ස්වාමින්ගේ නාමය නිකරුණේ පාවිච්චි නොකරන්න."

*අන්තිම හය මිනිසාට අප ආදරය දන්වයි*

# දස පනත (ඉතිරි පනත්)

5. "ඔබගේ පියාටත් මවටත් ගෞරවය කරන්න."

6. "මිනී නොමරන්න."

7. "වෛශ්‍යකම් නොකරන්න."

8. "සොරකම් නොකරන්න."

9. "ඔබේ අස්ල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොදෙන්න."

10. "ඔබේ අසල්වැසියාගේ... කිසිම දෙයකට ආසා නොකරන්න."

දෙවිඳුට කීකරුකම අප යාඥාවන්ට පිළිතුරු ගෙන එයි

**තවද අපි එතුමගේ පනත් රැකගනිමින් එතුමා ඉදිරියේ ප්‍රසන්න දෙය කරන බැවින් අපි එතුමගෙන් ඉල්ලන සියල්ල ලබමුව.**

- 1 යොහන් 3:22

# උතුම්ම පනත් දෙක

## *දෙවියන්ට අප ආදරය*

**01. යේසු : ඔබේ මුළු සිතින්ද, ඔබේ මුළු ආත්මයෙන්ද, ඔබේ මුළු බුද්ධියෙන්ද, ඔබේ දෙවි වූ ස්වාමින්ට ආදරය වෙන්න. මෙය උතුම්ම පළමු පනතය.** - මතෙව් 22:37, 38

## *මිනිසාට අප ආදරය*




**02. මේ හා සමාන දෙවන එකක්ද ඇත; එනම්, ඔබට මෙන් ඔබේ අස්වැසියාට ආදරය වෙන්න.** - මතෙව් 22:39

පිටු 34, 35 ඇති මුළු දස පනතම මෙම උතුම් පනත් දෙකේ අඩංගුව ඇත.

# ආදරය සියල්ලට වඩා උතුම්ය

## "උතුම් ආදරයේ පරිච්ඡේදය"

(1 කොරින්ති 13:1-8, 13)

[1]මිනිසුන්ගේද දේවදූතයන්ගේද, භාෂාවලින් මම කතා කරතත්, ආදරය මට නැත්නම් හඬනගන පිත්තලට හෝ කිංකිණි නද අත්තලමකට සමානව මම සිටිමි. [2]අනාගතවාක්‍යය කීමේ දීමනාව ඇතිව මම සිටියත්, සියලු රහස් හා සියලු දැනගැන්ම දැන සිටියත්, කඳු පහකරන ඇදහිල්ල ඇතිව සිටියත්, මට ආදරය නැත්නම් මම හිස්ය. [3]මට ඇති සියල්ල දිළිඳුන්ගේ පෝෂණයට දුන්නත්, මගේ ශරීරය පුළුස්සන්ට දුන්නත්, මට ආදරය නැත්නම්, එයින් මට කිසි ප්‍රයෝජනයක් නොම වෙයි.
[4]ආදරය බොහෝ ඉවසිලිවන්තය, කරුණාවන්තය, ඊර්ෂ්‍යා නොකරයි.

ආදරය පාරට්ටුකර නොගනියි, 5උඩඟු නොවෙයි. අවලස්සනව
නොහැසිරෙයි, තමාගේම කාරණා නොසොයයි. කෝප නොවෙයි, නපුර
ගනන් නොගනියි. 6අධර්මිෂ්ඨකමට ප්‍රීති නොවී, සැබෑව සමග ප්‍රීතිවෙයි.
7සියල්ල දරාගනියි. සියල්ල විශ්වාස කරයි, සියල්ල බලාපොරොත්තු
වෙයි, සියල්ල ඉවසයි, 8කිසිකලෙක ආදරය පහනොවෙයි, අනාගතවාක්‍යය
පවා නැතිවෙයි, භාෂා පවා නවතියි, දැනගැන්ම පවා නැතිවෙයි.

13දැන් පවතින්නේ ඇදහිල්ල, බලාපොරොත්තුව, ආදරය යන මෙම
තුනය; ආදරය මෙයින් ඉතා උතුම් එකය.

## දෙවියන් ආදරයයි

“.........දෙවියන් නම් ආදරයයි; ආදරයේ පවතින්නා දෙවියන් තුල සිටියි, දෙවියන්ද ඔහු තුළ සිටියි.”

- 1 යොහන් 4:16

# එතුමා ගැන අප අන්අයට කියා දීම යේසුගේ කැමැත්තය

(ගෙදරදී, ගමේදී, පාසැලේදී, පල්ලියේදී, හෝ ඕනෑම තැනකදී)

යේසු : "**ගෙදර යන්න ඔබේ මිතුරන් වෙත; කොපමණ මහත් දේ ස්වාමින් ඔබට කළේද කියාත්, එතුමා ඔබට අනුකම්පා කළ සැටිත්, ඔවුන්ට කියන්න**"

- මාර්ක් 5:19



# සැබෑ දේව දරුවෙක්ව අඳුනාගැනීම

**"එබැවින් ඔවුන්ගේ පලවලින් ඔවුන්ව ඔබලා අඳුනති"** - මතෙව් 7:20

**"නමුත් ආත්මයාණන්ගේ පල නම්, ආදරය, ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම...."**

- ගලාති 5:22, 23

## සැබෑ දේව දරුවා අන් අයට සමාව දෙයි

**මක්නිසාද, මිනිසාට ඔවුන්ගේම වරද, ඔබලා කමා කරත් නම්, ඔබලාගේ ස්වර්ගීය පියාණන්ද ඔබලාටත් කමා කරයි.** - මතෙව් 6:14

## දෙවියන් පිළිකුල් කරන කරුණු හත

**උඩඟු බැල්ම, බොරුකාර දිව, නිදොස් ලේ වගුරුවන දෑත්, දුෂ්ඨ උපා යොදන සිත, නපුරට දිව්මෙහි ලා ඉක්මන් වන පාද, මුසාවන් කියන බොරු සාක්ෂිකාරයා, සොයුරන් අතර භේද පතුරුවන්නා.** - හිතෝපදේශ 6:17-19

# මාංසයේ ක්‍රියා




"......වෛශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම, රූප වැඳීම, මායාව, සතුරුකම, විවාදය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, පක්ෂවාදීකම, බේද, ලබ්ධි බේද, වෛරය, බීමත්කම, ....සහ එවැනි දෙය...... මෙබඳු දෙය කරන්නන්ට දෙවියන්ගේ රාජ්‍ය උරුමකරගන්නට නොහැකිය." - ගලාති 5:19-21

"......තවද.....සමලිංගිකයෝවත්, සොරුවත්, ලෝබයෝවත්......." - 1 කොරින්ති 6:9-10

## එතුමගේම ආත්මයෙන් ඔබව පුරවා, ඔබව පිරිසිදු කිරීමට යේසුට ඉඩ දෙන්න

**ඔබලගෙන් සමහරු එබන්දෝව සිටියහ. නමුත් ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්ගේ නාමයෙන්ද, දෙවියන්ගේ ආත්මයාණන් තුළද ඔබලා සෝදනු ලැබුවහුය, පිරිසිදු කරනු ලැබුවහුය....** - 1 කොරින්ති 6:11

# අපාය සැබෑ තැනකි

(ලුක් 16:19-26 දක්වා කියවන්න)



යේසුස් ක්‍රිස්තුස්ව පමණක් ඔබ තදින් විශ්වාස කරන්න.

එවිට එතුමා ඔබේ නම ජීවන පොතේ ලියනවා ඇත.

**යමෙකුගේ නම ජීවන පොතේ ලියා නැති බව සම්බවීද, ඔහුව ගිනිවිලට හෙළන ලදී.**

- එළිදරව් 20:15

# දෙවියන් වෙත එකම මඟ යේසුය

"........දෙවියන් අපට සදාකාල ජීවනය දුන්නේය. ඒ ජීවනය ඇත්තේ එතුමගේ පුතුනුවන් (යේසු) තුළය." - 1 යොහන් 5:11

"පාපයේ කුලිය නම් මරණය වෙයි: නමුත් දේව දීමනාව නම් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් තුළ සදාකාල ජීවනය වෙයි."
- රෝම 6:23

"පුතුනුවන් (යේසු) කෙරෙහි අදහන්නාට සදාකාල ජීවනය ඇත. නමුත් පුතුනුවන්ට කීකරු නොවන්නා ජීවනය දකින්නේ නැත. නමුත් දේව උදහස ඔහු කෙරෙහි පවතියි." - යොහන් 3:36

යේසු : "මාර්ගයද, සැබෑවද, ජීවනයද, මමය. මා තුළින් මිස කිසිවෙක් පියාණන් වෙත පැමිණෙන්නේ නැත." - යොහන් 14:6

# ස්වර්ගය සැබෑ තැනකි



අලුත් සවර්ගයක් හා පොළොවක් දුටු බව එළිදරව් 21 පරිච්ඡේදයෙන් යොහන් අපට දන්වා සිටියි.

**"ඔවුන්ගේ ඇස්වලින් සියලු කඳුළු දෙවියන්ම පිසදමයි, මරණය තවත් නොවන්නේය, වැළපීමත්, හැඬීමත්, වේදනාවත් තවත් නොවන්නේය. මක්නිසාද, පළමු දේවල් පහව ගියේය.... සිංහාසනය මත වැඩ සිටින එතුමා මම සියල්ල අලුත් කරමියි....." කීවේය.**

- එළිදරව් 21:4, 5

අලුත් යෙරුසලම නැමති ශුද්ධ නුවර ස්වර්ගයේ සිට දෙවියන්ගෙන් පහළට එමද යොහන් දුටුවා. **......නුවරද විනිවිද පෙනෙන වීදුරුවලට සමාන පිවිතුරු රන්ය. නුවර පවුරේ අත්තිවාරම් සියලු ආකාර අනගි ගල්වලින් සරසා තිබුණේය.** - එළිදරව්. 21:18,19

# එතුමා තුළ විශ්වාස කරන සැමදෙන වෙනුවෙන් තැනක් පිළියෙල කිරීමට යේසු ස්වර්ගයට ගොස් ඇත



**ඔබලගේ සිත් නොකැළඹේවා. ඔබලා දෙවියන් කෙරෙහි විශ්වාස කරන්න, මා කෙරෙහිද විශ්වාස කරන්න. මාගේ පියාණන්ගේ නිවසේ (ස්වර්ගයේ) බොහෝ වාසස්ථාන ඇත. එසේ නොවේ නම් මා ඔබලට කියනවා ඇත. මම ඔබලට තැනක් පිළියෙල කරන පිණිස යමි. මම ගොස් ඔබලට තැනක් පිළියෙල කරයි නම්, මම සිටින තැන ඔබලත් සිටින පිණිස මා නැවත පැමිණ ඔබලව මා වෙත ගනිමි.** - යොහන් 14:1-3

## එම සුබ ආරංචිය අන් අයට පවසන්න

"යේසු : **ඔබලා මුළු ලොව මුළුල්ලේම ගොස් සියලු මිනිසුන්ට සුබ ආරංචිය පවසන්න.**" - මාර්ක් 16:15

"**....ආත්ම දිනාගන්නා නුවණැති කෙනෙකි.**" - හිතෝපදේශ 11:30

# දේව දරුවන්ට දේව පොරොන්දු

**"...කිසිසේත් මම ඔබෙන් අහක්ව නොයමි.........ඔබව අත්නාරිමි."** - හෙබ්‍රෙව් 13:5

**"ඔබේ සියළු මාර්ගවලදී ඔබව ආරක්‍ෂා කරන පිණිස එතුමා සිය දූතයන්ට අණ දෙන්නේය."** - ගීතාවලිය 91:11

**"......මාගේ පියාණන්ගේ අතින් ඔවුන්ව උදුරාගන්න කිසිවෙකුට නුපුළුවන."** - යොහන් 10:29



**"....ලෝකාන්තිමය දක්වා සැමකල්හිම මම ඔබ සමග සිටිමි."** - මතෙව් 28:20

**"......ඔබ විඳින්න යන දේවලට භය නොවන්න.......මරණය දක්වා විශ්වාසව ඉන්න. එවිට මම ඔබට ජීවනයේ ඔටුන්න දෙමි."** - එළිදරව් 2:10

**".........මා අඳුරේ සිටින විට, ස්වාමින් මට ආලෝකයක්ව සිටියි."** - මීකා 7:8

**"මට අඬගසන්න, මම ඔබට උත්තර දෙමි."** - යෙරෙමියා 33:3

# යේසු නැවත එයි



*සියල්ලන්වම මරණීන් නැගිටවනු ලබයි.*

**මේ ගැන මවිත නොවන්න. මක්නිසාද, සොහොන් ගෙවල්වල සිටින සියල්ලන්ට එතුමගේ හඬ ඇසෙන පැය පැමිණ, යහපත කළ අය ජීවනයේ නැවත නැගිටීමටත්, නපුර කළ අය විනිශ්චයේ (අපායේ) නැවත නැගිටීමටත් පිටත්ව එති.**

- යොහන් 5:28,29



*යේසුස් ක්‍රිස්තුස් තුළ මළවුන් පළමුව නැගිටිති*

**එවිට ජීවත්ව ඉතිරිව සිටින අපි එක්විටම ඔවුන් සමග ස්වාමින්ව හමුවීම පිණිස වළාකුල්වලින් අහසට ඇදගනු ලබමුව. මෙසේ අපි නිතරම ස්වාමින් ඉදිරියේ සිටිමුව.** -1 තෙසලෝනික 4:16,ආ, 17

**ඒ කාලය ඔබලා නොදන්නා බැවින්......අවදිව යාඥා කරන්න.** - මාර්ක් 13:33

# යේසු නැවත එන්නේ කෙසේද ?

**"බලන්න, වළාකුල්වලින් එතුමා එන්නේය; සියලු ඇස්ද..........එතුමව දකිති....."**

බොරු ක්‍රිස්තුස්ලාගෙන් හා බොරු අනාගතවක්තෘ-ලාගෙන් ප්‍රවේසම් වන්න.



**"......යමෙක් ඔබට කියයි නම්, බලන්න, ක්‍රිස්තුස් මෙතනය නැතහොත් එතනය, විශ්වාස නොකරන්න ..........බලන්න එතුමා වනාන්තරයේ සිටියි කියා ඔබලාට කියයි නම්, පිටත්ව නොයන්න. බලන්න, එතුමා ඇතුළ් ගෙවල්වල සිටියි කියා ඔබලාට කියයි නම්, විශ්වාස නොකරන්න."**

- මතෙව් 24:23 26

## අහසේ වළාකුල්වලින් යේසු ව්ගස එයි

**මක්නිසාද, යම්සේ විදුලිය පෙරදිගින් නික්ම අපරදිග දක්වා පෙනෙයිද, මනුෂ්‍ය පුත්‍රයාගේ (යේසුගේ) ඒමද එසේමය....එවිට පොළොවේ සියලු ගෝත්‍රයෝ.........බලපරාක්‍රමයෙන්ද, මහත් තේජසින්ද අහසේ වළාකුල් පිට මනුෂ්‍ය පුත්‍රයා එනවා දකිති.** - මතෙව් 24:27,30

# එඬේරාගේ ගීතිකාව

(ගීතාවලිය 23)

[1]ස්වාමින් මාගේ එඬේරාය, මට හිඟයක් නොවන්නේය. [2]එතුමා මා නිල් ගොදුරු
බිම්වල ලගින්ට සළස්වන්නේය. නිසල දිය අසලින් එතුමා මා ගෙන යන්නේය.
[3]එතුමා මාගේ ආත්මය ප්‍රාණවත් කරන්නේය. සිය නාමය නිසා දමිටු මාවත්වල
එතුමා මා ගෙන යන්නේය.

[4]එසේය, මරණ සෙවනේ මිටියාවතින් මම යන්නෙමි නමුත්, කිසිම නපුරකට
මම බය නොවෙමි; මක්නිසාද ඔබ මා සමඟය. ඔබේ දණ්ඩෙන් හා
සැරයටියෙන් මට සැනසිල්ල ලැබේ. [5]මාගේ සතුරන් ඉදිරියේ එතුමා මට
කෑම මේසයක් පිළියෙළ කරයි; තෙලින් මාගේ හිස ආලේප කරයි; මාගේ
කුසලාන උතුරා යයි.

[6]සැබවින් යහපතත්, කරුණාවත් මාගේ ජීවිතයේ සියළු දවස්වල මා අනුව
එන්නේය. සදාකල්ම මම ස්වාමින්ගේ නිවසේ වාසය කරන්නෙමි.

Published in numerous languages by World Missionary Press, Inc. as God supplies funds in answer to prayer. If you would like more copies for prayerful distribution, specify which language(s) you need and how many booklets.

Distributed free of charge by:

**Every Home Crusade, 6 Park Place, Colombo**



නොමිලේ විකිණීමට නොවේ

Read booklets online or by App
www.wmp-readonline.org

www.wmpress.org

6-17

2239 Sinhala WTG